## ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

එක් එක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳ සියලු විස්තර මතු දැක්වෙන අතර, අදාළ සුදුසුකම් සපුරා නොමැති කිසිම අපේක්ෂකයෙකු ලියාපදිංචි වීම සඳහා අයදුම් නොකළ යුතු ය.

**ඒ ඒ විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණක් ලියාපදිංචි කර ගන්නා බැවින් අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ දී ඉහළ ම z ලකුණු ලබා ඇති අයට ප්‍රමුඛතාව ලබා දීමේ පදනම මත අදාළ අපේක්ෂකයන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ ප්‍රතිඵල මත හැරුණු විට අදාළ සනාතන සභාව අනුමත කරන ලද වෙනත් සුදුසුකම් මත ද ඉතා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගනු ලැබේ.**

**(අ.) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් අනුමත විෂයයන් අතුරෙන් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.**

**(ඉහත සුදුසුකම යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමේදී අ.පො.ස. (සා.පෙළ) සම්මාන 3ක් සමඟින් ගණිතය ඇතුළුව විෂයන් 06 කින් එක් වතාවක දී සමත් වී තිබීම හෝ සම්මාන 3ක් සමඟින් විෂයන් 05ක් එකවර සමත් වී තවත් වතාවක දී ගණිතය විෂය සම්පූර්ණ කර තිබීම සහ සම්මාන 03ක් සමඟින් ගණිතය ඇතුළුව විෂයන් 06 කින් එක් වතාවක දී පිරිවෙන් අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම හෝ සම්මාන 03 ක් සමඟින් විෂයයන් 05ක් එකවර සමත් වී තවත් වතාවකදී ගණිතය විෂය සම්පූර්ණ කර පිරිවෙන් අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම හෝ අත්‍යවශ්‍ය වේ.**